පේදුරුතුඩුව නගර සභාව
යාපනය දිස්ත්‍රික්කය
---------------------

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 21 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජුලි 17 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට පේදුරුතුඩුව සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ වාහන 04 ක අයිතිය සභාවේ නමට මාරුකර නොතිබූ අතර, ඒවායේ වටිනාකම් ගිණුම්වලට ගෙන තිබීමෙන් මෝටර් වාහනවල වටිනාකම රු. 4,520,000 ක් ගිණුම්වල වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සභාවේ නමට අයිතිය මාරු නොකළ වාහනවල වටිනාකම තක්සේරුකර අවසන් ගිණුම්වලට ගෙනවිත් තිබීමෙන් රු. 270,900 ක් වටිනා මෝටර් වාහනවල වටිනාකම ගිණුම්වල වැඩියෙන් දක්වා තිබුණි.

1.3.3 ලේඛන හා පොත්පත් නොපැවැත්වීම

සභාව විසින් වන්දි ලේඛනය, මිණුම්පත්‍ර ලේඛනය හා ඉඩම් විකුණුම් ලේඛනය යනාදි ලේඛන පවත්වා නොතිබුණි.

1.3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | නගර සභා රෙගුලාසි පරිච්ඡේදය III | වරිපනම් බදු ලැයිස්තුව නොවැම්බර් 15 දිනට ප්‍රථම ලේකම්වෙත භාරදී දෙසැම්බර් 15 දිනට ප්‍රථම ගෙවීම් |

| | | |
|---|---|---|
| | වගන්තිය 54(1) | සිදුකළයුතුවූවත් එසේ ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | රු. 401,500 ක් වටිනා වර්ෂ දෙකක් ඉක්මවූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 1990 ඔක්තෝබර් 10 වන දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන වල ඉන්ධන දහනය පරීක්ෂාකර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලය පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 29,497,752 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 31,138,713 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,640,961 ක පහත වැටීමක් පෙන්නුම් කෙරිණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
------------------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සභාවේ මූල්‍ය ප්‍රතිඵලය ශුද්ධ අතිරික්ත රු 6,633,599 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු. 10,505,737 ක් විය. මෙය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 3,872,138 කින් පහත වැටීමක් පෙන්නුම් කෙරිණි.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය
-------------------------------------

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සභාවේ කාරක ප්‍රාග්ධනය රු. 188,639,153 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 177,637,018 ක් වී තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනයේ රු. 11,002,135 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.4 ආදායම් පරිපාලනය
-----------------------

2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය
-------------------------------------

ලේකම් විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2016<br>ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 985 | 1,078 | 3,342 |
| බදු කුලී | 16,093 | 9,111 | |
| බලපත්‍ර ගාස්තු | 560 | 876 | |
| වෙනත් ආදායම් | 70,698 | 63,468 | 41,793 |
| එකතුව | 88,336 | 74,534 | 45,135 |

2.4.2 වරිපනම් බදු

රු. 1,895,390 ක අයවියයතු වරිපනම්බදු මෙතෙක් අයකර ගෙන නොතිබුණි.

2.4.3 මුද්දර ගාස්තු

රු. 26,899,879 ක් වටිනා මුද්දර ගාස්තු අයකර ගෙන නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 103 ක්වුවද, තත්‍ය සේවක සංඛ්‍යාව 89 කි. ඒ අනුව, පුරප්පාඩු සංඛ්‍යාව 14 කි.

(ආ) සභාවේ ක්‍රියාකාරකම් කාර්යක්ෂමතාවයෙන් පවත්වා ගෙන යාම සඳහා වාර්ෂිකව විගණන කළමනාකරණ කමිටු රැස්වීම 04 ක් පැවැත්විය යුතුය. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේ විගණන කළමනාකරණ කමිටු රුැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

3.2 ඌන උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රෝද දෙකේ ට්‍රැක්ටර් රථයක් වර්ෂ 5 ක කාලයක සිට ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) රු. 1,545,182 ක් වටිනා රථ ගාල ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

රු. 4,768,000 ක් වටිනා ප්‍රාග්ධන වැඩ 04 ක් අත්හැර දමා තිබුණි.

3.4 අපද්‍රව්‍ය කළමනාකරණය

සභාව විසින් එකතු කරන අපද්‍රව්‍ය වර්ගීකරණ කිරීමකින් තොරව ගොඩගසා තිබුණි.

4 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
----------------------------------------

4.1 අයවැය පාලනය
-----------------

වියදම් ව්‍යුහය
--------------

අයවැයගත වියදම් සහ තත්‍ය වියදම් අතර රු. 19,423 සිට රු. 10,709,150 දක්වා වියදම් විචලනයක් පැවතුනු බව විගණනයේදී නිරික්ෂණය විය.

4.2 නොවිසඳී ඇති විගණන විමසුම
---------------------------------

අවිධිමත් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන විමසුමට මෙතෙක් විසඳී නොතිබුණි.